**යාපනය විශ්වවිද්‍යාලය - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

යාපනය විශ්වවිද්‍යාලයේ("විශ්වවිද්‍යාලය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 වන ඡේදය ප්‍රකාරව වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය. කෙසේ වෙතත්, සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවදුරටත් භාවිතා කරනු ලබන වටිනාකම රු.48,516,123ක්වූ දේපළ, යන්ත්‍ර සහ උපකරණ සමාලෝචිත වර්ෂය අවසානයේ දීත් සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව මූල්‍ය ප්‍රකාශනවල එම ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පවතින වත්කම් අයිතම සංඛ්‍යාව, දරන වියදම් සහ කාලය ගතවන ආකාරය සැලකිල්ලට ගනිමින්, යාපනය විශ්ව විද්‍යාලය විසින් අනුගමනය කරනු ලබන පිරිවැය ආකෘතිය සහ ක්ෂයවීම් ප්‍රතිපත්තිය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමය දක්වා වෙනස් කිරීම සඳහා කවුන්සිලයේ නිර්දේශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය මත ආරම්භ කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | ස්ථාවර වත්කම් වෙන්දේසි කිරීමෙන් ලැබුණු රු.2,374,180 ක ආදායම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 80 සහ 81 ඡේදවලට අනුව වත්කම් ඉවත් කිරීමේ ගිණුමක් හරහා ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන ඇත. තවද වෙන්දේසි කරන ලද වත්කම්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂය ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති හා ඉදිරියට ගෙන එන ලද වත්කම්වල වටිනාකම ශුන්‍ය වන අතර බැවින් වෙන්දේසියෙන් ලැබුණු සම්පූර්ණ විකුණුම් ආදායම අතිරික්තයක් ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත. වත්කම් ලේඛනයෙන් හඳුනා නොගත් බැහැර කරන ලද වත්කම් සභා අනුමැතිය ලැබුණු පසු පද්ධතියෙන් ඉවත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග ලෙස ලැබුණු රු.1,280,240 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල | එම පරිත්‍යාග මූල්‍ය කමිටුවට ඉදිරිපත් කර ඇති අතර එම ගොඩනැගිල්ල විශ්වවිද්‍යාල ගිණුම් පොත්වලට ගත් වහාම | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු |

| | | |
|---|---|---|
| හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි. | මෙම වත්කම් පරිත්‍යාග වලට එකතු කිරීමට කටයුතු කර ඇත. | කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ගිණුම් යටතේ සඳහන් කර ඇති රු.1,009,338 ක ආපදා ණය ශේෂය අයකර ගැනීමට වසර 03 සිට අවුරුදු 27 දක්වා කාලසීමාවක් ගතවී ඇතත්, එම ශේෂය අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ මුදල් සේවක පාරිතෝෂිත දීමනාවලින් හැකි ඉක්මනින් අයකර ගැනීමට පියවර ගෙන ඇත. | අයවිය යුතු මුදල් නියමිත කාලය තුළදී අයකර ගැනීමට පිළියම් යෙදිය යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2) | (i) | ලබා ගත් අත්තිකාරම් අදාළ කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 68 කදී ලබා දී තිබූ එකතුව රු.2,706,567 ක් දින 12 සිට දින 89 දක්වා ප්‍රමාද කාලයකින් පසු පියවා තිබුණි. | දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නියමිත කාලය තුළ අත්තිකාරම් පියවීම සඳහා සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා අභ්‍යන්තර මූල්‍ය චක්‍රලේඛ නිකුත් කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| | (ii) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හරහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව උප අග්‍රිම ලබාදිය හැකි රු.100,000 උපරිම සීමාව ඉක්මවා අවස්ථා 25කදී එකතුව රු.3,724,669ක අත්තිකාරම් ලබා දී තිබුණි. | සියලුම අත්තිකාරම් උපරිම සීමාව වන රු.100,000.00 චෙක්පත් ලබා දී තිබුණු අතර කිසිදු තත්වයක් යටතේ චක්‍රලේඛ උල්ලංඝනය කර නොමැත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | අංක 03/2022 දරනජාතික අයවැය චක්‍රලේඛයේ 03(X) වගන්තිය | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට 2022 දෙසැම්බර් 31 දින දක්වා ණය පහසුකම් ලබාදීම අත්හිටුවා තිබුණි. කෙසේ වෙතත්, අවස්ථා 22කදී එකතුව රු.5,500,000 ක මුදලක් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට ආපදා ණය වශයෙන් ලබා දී තිබුණි. | සඳහන් කරන ලද නිලධාරීන්ට විශ්වවිද්‍යාලය විසින් ණය ලබාදීම අයකර ගන්නා ලද ප්‍රාග්ධන මුදලින් සිදුකර ඇත. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේද 3 | (i) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස රු.2,295,150,010ක් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාන්‍යයෙන් පැමිණීමේ ලේඛනයේ අත්සන් නොකරන අතර මෙම කාරණය 2017.11.11 දින පැවති කෝප් රැස්වීමේදී සතුටුදායක ලෙස පැහැදිලි කරන ලදී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | (ii) පැමිණීම් සහ පිටවීම් තහවුරු කිරීමකින් තොරව අතිකාල සහ නිවාඩු දින වැටුප් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.31,819,145 ක් ගෙවා තිබුණි | කොරෝනා ව්‍යාප්තිය සහ ආර්ථික අර්බුද නිසා ඇඟිලි සලකුණු ස්කෑන් යන්ත්‍රය භාවිත නොකරන ලදී. කෙසේ වෙතත්, සහතික කළ සහ බලයලත් පැමිණීමේ ලේඛනයට අනුව අතිකාල සහ නිවාඩු දින වැටුප් ගෙවීම සිදු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිහිටුවීමේ චක්‍රලේඛය | විභාගය පවත්වා මාස 3ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද 2019 වසරේ සිට 2021 වසර දක්වා විශ්වවිද්‍යාලයේ පීඨ 6ක පැවැත් වූ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 03 සිට මාස 22 දක්වා කාලයක් ගත වී තිබුණි. | මෙම ක්‍රියාවලිය සමීපව නිරීක්ෂණය කිරීමට කටයුතු කර ඇති අතර පෙර වසරට සාපේක්ෂව ප්‍රතිඵල නිකුත් කිරීමේ සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබේ. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.619,419,916 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවරුද්ධ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,250,028,585 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,869,448,501 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුනරාවර්තන ප්‍රදානය සහ විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ප්‍රාග්ධන ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගත වූ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය හැත්තෑ එක්දෙනෙකු (71) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසි එක්දෙනෙකු (21) ශිෂ්‍යත්ව අවසන් කර නැවත රාජකාරි සඳහා වාර්තා කිරීමට හෝ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වීමට හෝ කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, 1980 සිට 2022 දක්වා කාලපරිච්ඡේදයට අදාලව ගිවිසුම් කඩ කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු. 130,105,033ක්වූ බැඳුම්කර වටිනාකම අය කර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | බැඳුම්කර පැහැර හරින්නන් විසින් උකස් කර ඇති බැඳුම්කර දේපළ හරහා ඉතිරි බැඳීම් අය කර ගැනීමටත්, සියලු පැහැර හැරීම් සඳහා ඉල්ලීම් ලිපි යැවීමටත් නීති දෙපාර්තමේන්තුව හරහා නීතිමය පියවර ගැනීමටත් තීරණය කර ඇත. | කඩ කළ බැඳුම්කර මුදල් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට වහා පියවර ගත යුතුය. |